**<u>ඔබේ ගෞරවය සහ අභිමානය රැකගන්නː ශ්‍රී ලංකා හමුදා ප්‍රවීණයන් වෙත කෙරෙන ඉල්ලීමක්</u>**

ශ්‍රී ලාංකීය ත්‍රිවිධ හමුදා සාමාජිකයන් වශයෙන් අපි අපගේ මාතෘභූමිය පිළිබඳව ගෞරවනීය හැඟීමකින් හා පක්ෂපාතීත්වයකින් බැඳී සිටින්නෙමු. එමෙන්ම, ජාතියේ යහපත වෙනුවෙන් කැපවෙමින් මාතෘභූමිය මුහුණදෙන සෑම අභියෝගාත්මක අවස්ථාවකදීම නිර්භීතව ඒ වෙනුවෙන් පෙනී සිටිමින් නැගී සිටින්නෙමු. එනමුදු, කෙටි කාලීන මුදල් ඉපයීම හා තාවකාලික යසඉසුරු සපයාගැනීම සඳහා එම අභිමානය හා පක්ෂපාතිත්වය අත්හැරදැමීමට අප අතරින් යම් පිරිසක් පොළඹවාගැනීමට දරනු ලබන රහසිගත උත්සාහයන් පිළිබඳව මෙම කාලසීමාවේදී නිරීක්ෂණය වේ.

ශ්‍රී ලාංකීය හමුදාවන් නියෝජනය කළ විශ්‍රාමිකයින් කිහිප දෙනෙක් විවිධ විදේශීය කුලී හේවා කණ්ඩායම් නියෝජනය කිරීම සඳහා විදෙස් රාජ්‍යයන් වෙත ගොස් තිබෙන බව මෑතකාලීනව පලවූ වාර්තා හා සිදුවීම් මගින් අනාවරණය වී තිබෙන කරුණකි. බොහෝ කාලයක් අපගේ මාතෘභූමියේ පැවැත්ම වෙනුවෙන් රණකාමීන් සහ දේශප්‍රේමීන් ලෙස අභිමානනීය සේවාවක් ඉටුකළ මෙම රණවිරුවන් විවිධ වූ පොරොන්දු සහ ලාභ ප්‍රයෝජනයන්ට මුලාවී මෙම කුලී හේවා කණ්ඩායම් සමග එක්වීමට උත්සාහ දරන තත්වයක්ද නිරීක්ෂණය වී තිබේ.

අපගේ වීරෝදාර රණවිරුවන් රට වෙනුවෙන් කළ අප්‍රමාණ කැපකිරීම් කිසිදා අමතක කළ නොහැක. එසේම, අනේකවිධ දුෂ්කරතා විඳිමින් මාතෘභූමිය වෙනුවෙන් ලේ වගුරවමින් අපගේ සහෝදර සෙබලුන් ඔවුන්ගේ ජීවිත පරිත්‍යාගයෙන් මාතෘභූමියේ ස්වෛරීත්වය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් සටන් කළ අයුරු අප දැක ඇත්තෙමු. අපගේ වීරෝදාර රණවිරුවන් සතු නිර්භීතකම පුද්ගලික වාසි සඳහා වෙළඳාම් කළ යුතු භාණ්ඩයක් නොවේ; එය  මාතෘභූමියේ ආරක්ෂාව සහ පැවැත්ම වෙනුවෙන් අපගේ රණවිරුවන් විසින් සිදුකරනු ලැබූ උත්තරීතර පරිත්‍යාගයකි.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා WWV RWP RSP VSV USP ndc psc MPhil, ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ සේවය කරන ජ්‍යෙෂ්ඨතම හමුදා නිලධාරියා ලෙස මෙන්ම වීරෝදාර රණවිරුවන් සමඟ යුධභූමියේ උරෙන්උර ගැටී සටන් කල ජ්‍යේෂ්ඨ නිලධාරියෙකු ලෙස වර්තමානයේ ගොඩනැගී තිබෙන මෙම ප්‍රවනතාව පිළිබඳ තම දැඩි කනස්සල්ල පළකර ඇත. එසේම, මෙහි ඇති භයානකත්වය හා අනතුරුදායක බව පිළිබඳව විශේෂ අවධානයක් යොමුකරන ලෙසත් විවිධ කණ්ඩායම්වල පෙළඹවීම් මත මෙම කුලී හේවා කණ්ඩායම් වෙත රණවිරුවන් යොමුකිරිමේ වංචාකාරී ක්‍රියාවන්ට හසු නොවන ලෙසත් සියලුම විශ්‍රාමික රණවිරුවන්ගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටියි.

කුලී හේවා සටන් සම්මත යුධ උපක්‍රමයක් නොවන අතර එවන් මාර්ගයන් වෙත යොමුවීම අපගේ ගෞරවනීය ශ්‍රී ලාංකීය හමුදාවන්ගේ කීර්තිනාමයට කැළලක් සිදුකිරීමේ දැඩි අවධානමක් ඇති කරයි. ලෝකයේ කුරිරුතම ත්‍රස්තවාදී සංවිධානය පරාජය කළ ජයග්‍රාහී හමුදාවක සාමාජිකයන් ලෙස අප අපගේ වෘත්තියේ ගෞරවය හා අවංකභාවය ආරක්ෂා කළ යුතුය. සැබෑ නිර්භීතකම පවතින්නේ කෙනෙකුගේ වැටුපේ ප්‍රමාණයෙන් නොව අපගේ යහපත් ප්‍රතිපත්ති හා අරමුණුවලින් සන්නද්ධ විමෙන් බව අප වටහාගත යුතුය. තිස් වසරක් මාතෘභූමිය වෙනුවෙන් කැපවෙමින් ජීවිත පරිත්‍යාග කළ අපගේ වීරෝදාර සහෘද රණවිරුවන්ගේ පරිත්‍යාගයන්ට ගෞරව කරමින් ත්‍රිවිධ හමුදාවේ කීර්තිනාමය හා ප්‍රෞඩත්වය සුරක්ෂිත කිරීමට අපි සියලුදෙනාම කැපවෙමු.